## අකුරැස්ස ප්‍රාදේශීය සභාව
## මාතර දිස්ත්‍රික්කය.

1. මූල්‍ය ප්‍රකාශන.

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2011 සැප්තැම්බර් 22 දිනද, ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2010 ඔක්තෝබර් 15 දිනද විගණනයට ඉදිරිපත් කර තිබුණි.

1.2 මතය.

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව අකුරැස්ස ප්‍රාදේශීය සභාවේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත් මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට අකුරැස්ස ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල හා මූල්‍ය ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු.

පහත සඳහන් කරුණ නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයට අදාල වත්කම් හා වගකීම් වල ආරම්භක ශේෂ ගිණුම්ගත කිරීම සඳහා ජර්නල් සටහන් යොදා නොතිබුණි.

(ආ) වර්ෂයට අදාල ආදායම් හා වියදම්, ආදායම් හා වියදම් ගිණුමට මාරු කිරීම සඳහා ජර්නල් සටහන් යොදා නොතිබුණි.

(ඇ) ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයෙන් 2007 මාර්තු 02 දින සභාවට පරිත්‍යාගයක් වශයෙන් ලද බෝට්ටු දෙකක අගය තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ලැබිය යුතුව තිබූ රු.16,780 ක වෙළඳ බලපත්‍ර ගාස්තු, උසාවි දඩ මුදල් ලෙසට ගිණුම් ගතකර තිබුණි.

1.3.2 නොසැසඳූ පාලන ගිණුම්

ගිණුම් විෂයයන් 02 කට අදාල මූල්‍ය පකාශන අනුව ශේෂයන්ගේ එකතුව රු.31,640,396 ක් වූ අතර උපයෝගී ලේඛණ අනුව ගිණුම් ශේෂයන්ගේ එකතුව රු.34,555,458 ක් වූයෙන් වෙනස රු.2,915,062 ක් විය.

1.3.3 විගණනය සඳහා සාක්ෂි නොවීම.

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.65,244,151 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැක විය.

1.3.4 අනුකූල නොවීම්.

විගණනයේදී නිරීක්ෂණය වූ නීති, රීති, රෙගුලාසි ආදියට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති , රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1988 පාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | |
| (i) රීති 193 | අයවැයගත හා පරිපූරක සම්මත වැය සමග වැය විෂයන්හි තථ්‍ය ශේෂය සමග සසඳා අතිරික්ත හා ඌණතා පිළිබඳ හේතු දැක්වෙන ප්‍රකාශයක් පිළියෙල කර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| (ii) රීති 217,218 | සෑම ගිණුම් වර්ෂයකම දෙසැම්බර් 15 දිනට පෙර ස්ථාවර වත්කම් හා අනෙකුත් භාණ්ඩ සඳහා සමීක්ෂණ මණ්ඩලයක් පත්කර සමීක්ෂණ මණ්ඩල වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | |
| මු.රෙ.135 | නිලධාරීන් වෙත මූල්‍ය බලතල ලිඛිතව පවරාදීම සිදුකර නොතිබුණි. |

2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය.

2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සභාවේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.9,602,123 ක් වූ අතර එයට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.9,932,770 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්.

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාල ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු 2011 මාර්තු 03 දිනැති මාගේ ලිපියට අනුව නියමිත ආකෘතියක ඉදිරිපත් කරන ලෙස සභාපතිවරයාගෙන් ඉල්ලා තිබූ නමුත් තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි. කෙසේ වුවද අවසන් මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබූ හිඟ ආදායම් ප්‍රකාශ අනුව 2010 දෙසැම්බර් 31 දිනට පැවති තත්ත්වය ඉකුත් වර්ෂය සමඟ සසඳා සාරාංශ කර පහත දක්වා ඇත.

| විස්තරය | හිඟ ආදායම 2010 | 2009 | වැඩිවීම ප්‍රතිශතයක් ලෙස | අඩුවීම ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | රු. '000 | රු. '000 | % | % |
| අක්කර බදු | 56 | 48 | 16.6 | - |
| ජල ගාස්තු | 742 | 565 | 31.3 | - |
| බදුකුලී | 2,035 | 2,363 | - | 13.9 |
| බිම්බදු | 328 | 173 | 89.6 | - |

2.2.2 හිඟ බදු හා ගාස්තු

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව රු.56,428 ක හිඟ බදු හා ගාස්තු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 හා 159 වගන්තිවල විධිවිධාන අනුව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.2.3 කඩකුලී ආදායම්.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට අකුරැස්ස නාගරික වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 114 කින් රු.9,659,862 ක එක්වන් මුදල් අයවීමට තිබුණි. එමෙන්ම බදු ගිවිසුමේ කොන්දේස අංක 04 පරිදි කඩකුලී නොගෙවූ කඩ හිමියන්ගෙන් රු.1,765,536 ක් අයවීමට තිබුණි.

(ආ) අකුරැස්ස නාගරික වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 12 ක් ආපසු පවරා ගෙන තිබූ අතර එකී කඩකාමර වලින් 2010 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු රු.12,157 ක හිඟ ගාස්තු අයකරගෙන නොතිබූ අතර ගිවිසුමේ කොන්දේසි අංක 25 පරිදි ගිවිසුම් කාලය ඉකුත්වී තිබූ කඩකාමර 12 ක් සඳහා නැවත ගිවිසුම් අත්සන් කිරීමද සිදුවී නොතිබුණි

2.2.4 උසාවි දඩ මුදල්

විවිධ ආඥා පනත් යටතේ මහේස්ත්‍රාත් අධිකරණයකින් 2010 දෙසැම්බර් 31 දින දක්වා අයකර ප්‍රධාන ලේකම් වෙත එවා ඇති රු.273,693 ක් වූ දඩ මුදල් සභාවට ලැබිය යුතුව තිබුණි.

2.2.5 මුද්දර ගාස්තු

2010 දෙසැම්බර් 31 දිනට රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගෙන් රු.340,997 ක මුද්දර ගාස්තු ලැබිය යුතුව තිබුණි.

2.3 වියදම් ව්‍යුහය.

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා සභාවේ අයවැයගත හා තථ්‍ය වියදම අදාල විචලනයන්ද සමග පහත දැක්වේ.

| වියදම් විෂයය | 2010 | | | 2009 | | |
|---|---|---|---|---|---|---|
| | අයවැයගත | තථ්‍ය | විචලනය | අයවැයගත | තථ්‍ය | විචලනය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| | '000 | '000 | '000 | '000 | '000 | '000 |
| පුනරාවර්තන වියදම් | | | | | | |
| පෞද්ගලික පඩිනඩි | 18,958 | 15,949 | 3,009 | 18,958 | 15,242 | 3,716 |
| අනෙකුත් | 10,714 | 11,418 | (704) | 10,714 | 9,183 | 1,531 |
| උප එකතුව | 29,672 | 27,367 | 2,305 | 29,672 | 24,425 | 5,247 |
| ප්‍රාග්ධන වියදම | 37,283 | 27,576 | 9,707 | 37,283 | 30,923 | 6,360 |
| මුළු එකතුව | 66,955 | 54,943 | 12,012 | 66,955 | 55,348 | 11,607 |

## 2.4 මානව සම්පත් කළමනාකරණය.

### 2.4.1 අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව

2010 දෙසැම්බර් 31 දිනට සභාවේ අනමත සහ තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| සේවක ශ්‍රේණිය | අනුමත | තථ්‍ය |
|---|---|---|
| මාණ්ඩලික | 01 | - |
| ද්විතියික | 20 | 16 |
| ප්‍රාථමික | 45 | 26 |
| වෙනත් (අනියම්, තාවකාලික) | - | 21 |

(අ) සමාලෝචිත වර්ෂය සඳහා කාර්යය මණ්ඩල වැටුප් පිරිවැය රු.15,949,626 ක් වුවද පළාත් පාලන කොමසාරිස් විසින් ප්‍රතිපූර්ණය කර තිබුණේ රු.15,594,000 පමණක් වූ හෙයින් රු. 355,626 ක් වූ වෙනස සභා අරමුදලට වැයබරක් වී තිබුණි.

(ආ) භාණ්ඩාගාර ලේකම්ගේ 2002 ජනවාරි 03 හා 2006 අප්‍රේල් 10 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 14 හා අංක 28 මගින් පළාත් පාලන ආයතනවල අනියම්, ආදේශක හා කොන්ත්‍රාත් සේවකයින් බඳවාගැනීම අත්හිටුවා ඇතත් එකී විධිවිධාන වලට පටහැනිව සේවකයින් 21 ක් බඳවාගෙන සමාලෝචිත වර්ෂයේදී වැටප් වශයෙන් සභා අරමුදලින් රු.1,978,619 ක මුදලක් ගෙවා තිබුණි. එකී චක්‍රලේඛ උපදෙස් අභිබවා යමින් බඳවාගැනීම් සිදුකලහොත් ආයතන ප්‍රධානියා ඒ සඳහා පුද්ගලිකව වගකීමෙන් බැඳී සිටින බවද අවධාරණය කර තිබුණි.

2.5. වත්කම් කළමනාකරණය.

අයවීමට ඇති සේවක ණය.

සමාලෝචිත වර්ෂය අවසානයට අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ සේවක ණය අත්තිකාරම් ශේෂවල එකතුව රු.3,215,269 ක් විය.

2.6 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

2.6.1 සමාලෝචිත වර්ෂයේ සභා මන්ත්‍රීවරුන් 13 ක් සඳහා මන්ත්‍රී දීමනා ලෙස රු.798,000 ක් ගෙවා තිබූ අතර සභා රැස්වීම් 12ටම සහභාගී වී තිබුනේ මන්ත්‍රීවරුන් 05 දෙනෙක් පමණි.

2.6.2 2010 වර්ෂයේ අයවැය ලේඛණයෙන් රු.1,750,000 ක් වූ වැඩ යෝජනා 22 ක් අනුමත වී තිබුණදී එකී යෝජනා ක්‍රියාත්මක වී නොතිබූ අතර මන්ත්‍රීවරුන්ගේ වෙනත් යොජනා 13 ක් පමණක් ක්‍රියාත්මක වී තිබුණි. තවද පළාත් සභා සැලැස්මට අදාලව ඉදිකිරීම් කර්මාන්ත 03 කට ලද රු.140,000 ක මුදලින් එකී කර්මාන්ත ඉටු කිරීමද සිදුවී නොතිබුණි.

2.6.3 සභාවට අයත් මහජන පුස්තකාල තුනෙහි පාඨකයින් රැගෙන ගොස් ආපසු භාර නොදුන් රු.13,713 ක් වටිනා පොත් 116 ක අගය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.6.4 සභා බල ප්‍රදේශයේ අවසාන ගම් සිතියම් අංක 179 හි සඳහන් සභාව සතු ලොට් අංක 154 දරන කපිතන්ගොඩවත්ත නමැති රු.166,800 ක් වටිනා රූඩ් 03, පර්චස් 18 විශාල වූ ඉඩමේ ප්‍රමාණය පර්චස් 03 ක් ලෙසට ඉඩම් හා ගොඩනැගිලි ලේඛණයේ සටහන් කර තිබුණි

2007 ජුලි 31 දින මාසික බදුකුලී පදනමට බදු දී තිබූ ඉඩමේ ගිවිසුම් කොන්දේසි වලට පටහැනිව දෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකර ඇති බව 2011 ඔක්තෝබර් 28 දිනැති ස්ථානීය පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

2.7 අනවසර ඉදිකිරීම්.

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) 2008 වර්ෂයේ සිට 2010 වර්ෂය දක්වා අනවසර ඉදිකිරීම් 25 ක් පිළිබඳව සභාවට වාර්තා වී තිබුණද මෙම අනවසර ඉදිකිරීම සඳහා අනවසරකරුවන්වෙත දැන්වීමක් නිකුත් කිරීම හැර වෙනත් නීතිමය කියාමාර්ග කිසිවක් ගෙන නොතිබුණි.

(ii) ගොඩනැගිලි අයදුම්පත් අංක බීප්/76/2007 ට අදාලව අකුරැස්ස, අලුත්පාර, අංක 23, යන ස්ථානයේ වර්ග මීටර් 143.85 ක ප්‍රමාණයේ දෙමහල් ගොඩනැගිල්ල සඳහා 2008 මාර්තු 13 දිනැතිව නියමකල කොන්දේසි සපුරා නොමැතිව ගොඩනැගිල්ල ඉදිකර අනුකූලතා සහතිකයකින් තොරව ව්‍යාපාරික කටයුතු සිදුකරන බව 2011 ඔක්තෝබර් 28 දිනැති ස්ථානීය පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

- මෙම ගොඩනැගිල්ල, මාර්ගයේ මධ්‍ය රේඛාවේ සිට ගොඩනැගිලි සීමාව අඩි 40 ක් තිබිය යුතු වුවද භෞතිකව තිබුනේ අඩි 32 ක් වූ අතර ගොඩනැගිලි සැලැස්ම මකාදමා වෙනස්කම් කර තිබුණි.

- නාගරික සංවර්ධන අධිකාරියේ 1986 මාර්තු 10 අංක 392/9 සහ 2009 අප්‍රේල් 17 දින අංක 1597/8 දරන ගැසට් නිවේදන මගින් ප්‍රකාශිත නියමයන් ප්‍රකාර මෙම ගොඩනැගිල්ලේ බිම් මහලේ තිබිය යුතු වාහන නැවතුම් ස්ථාන නොමැති බව 2011 ඔක්තෝබර් 28 දිනැති ස්ථානීය පරීක්ෂාවේදී නිරීක්ෂණය වූ අතර අයකරගත යුතු රු.500,000 ක ගාස්තුද අයකරගෙන නොතිබුණි.

(iii) අනවසර ව්‍යාපාරික ගොඩනැගිලි 05 කින් නාගරික සංවර්ධන අධිකාරියේ 2009 අප්‍රේල් 17 දිනැති අංක 1597/8 දරණ ගැසට් නිවේදනයේ 6 (ii) ඡේදය පරිදි ආවරණ අනුමැතිය දීමේදී අයකර ගත යුතු රු.935,140 ක ගාස්තු අයකර නොතිබුණි.

2.8 අභ්‍යන්තර විගණනය.

සභාව තුල ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

3. පද්ධති හා පාලන.

පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කළ කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) අයවැය පාලනය
(ඇ) ආදායම් පරිපාලනය
(ඈ) වත්කම් කළමනාකරණය